මානවසම්පත්

# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No: MPS/HRD/HR12/Dist.Training/08/2022

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022. 11. 17

මානව සම්පත් සංවර්ධන ශාඛාව 25 NOV 2022 05 DEC

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

**<u>රාජ්‍ය සේවයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 01</u>**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස යොදා ගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම්සහගතව සංවර්ධනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

02. එම වැඩපිළිවෙල යටතේ සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මාර්ගගත ක්‍රමවේදය ( MS Teams) ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එහි පළමු අදියර කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්වල පිහිටි රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් 2023 ජනවාරි මස ආරම්භ කිරීමට නියමිත අතර එහි වැඩසටහන් සැලැස්ම පහත පරිදි වේ.

| අනු අංකය | පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන පැවැත්වීමට අපේක්ෂිත කාලය |
|---|---|---|
| 01 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව මූලික දැනුම | පැය 03 |
| 01.1 | සේවා ව්‍යවස්ථාව, බඳවා ගැනීම් පටිපාටිය හා භාෂා ප්‍රතිපත්තිය | පැය 02 |
| 01.2 | විනය ක්‍රියා පටිපාටිය | පැය 02 |
| 01.3 | නිවාඩු | පැය 02 |
| 01.4 | වැටුප් | පැය 02 |
| 01.5 | වන්දි හා දීමනා | පැය 02 |
| 02 | මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 03 |

DDE (L).
5/12.


දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

| | | |
|---|---|---|
| 03 | කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම | පැය 03 |
| 04 | ප්‍රසම්පාදනය පිළිබඳ මූලික දැනුම | පැය 03 |
| 05 | කාර්ය පටිපාටික රීති පිළිබඳ මූලික දැනුම | පැය 03 |
| 06 | තොරතුරු තාක්ෂණය ප්‍රායෝගික භාවිතය | පැය 03 |

03. මෙම පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් ලියාපදිංචි කර ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු සහ ආයතනවල සේවයේ නියුතු උක්ත පුහුණු වැඩසටහනට සහභාගී වීමට කැමත්තක් දක්වන නිලධාරීන් පහත ගුගල් සබැඳිය (Google Form) මඟින් හෝ QR කේතය (QR Code) මඟින් 2022.12.12 දිනට පෙර මේ සඳහා ලියාපදිංචි වීමට දැනුම්වත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. පුහුණු වැඩසටහන පැවැත්වෙන දිනයන් හා වේලාවන් පිළිබඳව එසේ ලියාපදිංචි වන නිලධාරීන්හට විද්‍යුත් තැපැල හරහා ඉදිරියේදී දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**Google Form Link**

https://docs.google.com/forms/d/e/1FAIpQLSfeVd9qC3aI92X9sxWJrz7VcgsQzvwZBZ0RvbpiUr1FUoLYyw/viewform?usp=sf_link

**Shorten Link**

https://forms.gle/kXRrXsmLbsGhRvVq9

**QR Code**

04. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍යවන්නේ නම් මානව සම්පත් සංවර්ධන අංශයේ සහකාර ලේකම් එච්. ආර්. සඳමාලි මහත්මිය, දුරකතන අංකය 011-2698464 හරහා සම්බන්ධ කර ගත හැකි වේ.

05. රාජ්‍ය සේවයේ මානව සම්පත සංවර්ධනය උදෙසා වන මෙම ප්‍රයත්නයට ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

කේ. ආර්. උඩුවාවල
අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකතන අංකය : 011 2698462
ෆැක්ස් අංකය : 011 2698461
විද්‍යුත්ලිපිනය : rohithakr21@gmail.com